සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2017**

| | | | |
|---|---|---|---|
| සිංහල II | 71 | S | II | පැය තුනයි |
| சிங்களம் II | | | | மூன்று மணித்தியாலம் |
| Sinhala II | | | | Three hours |

විභාග අංකය : ..........................

**උපදෙස්:**

- ※ **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ※ **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. '**සන්ධ්‍යක්ෂර**' අන්තර්ගත වරණය තෝරන්න.
(1) අ, ඉ, උ, ඍ (2) ආ, ඊ, ඌ, ඒ, ඕ (3) ඛ, ඤ, ඥ, ඟ (4) ඒ, ඓ, ඕ, ඖ (5) ය, ර, ල, ව (……)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) අරුණළු, කළණ, කාළගෝල, දැකුම්කලු, පිළිසරණ
(2) අරුණළු, කලණ, කාලගෝළ, දැකුම්කළු, පිළිසරණ
(3) අරුණලු, කලණ, කාළගෝළ, දැකුම්කලු, පිළිසරණ
(4) අරුණලු, කළණ, කාලගෝල, දැකුම්කළු, පිළිසරන
(5) අරුනළු, කලන, කාළගෝල, දැකුම්කලු, පිලිසරන (……)

1.3. **අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
(1) ගුරුළුගෝමී, වෑත්තැවේ, විද්‍යාචක්‍රවර්ති, ධර්මසේන
(2) බුද්ධපුත්‍ර, පැරකුම්බා, පරාක්‍රම පණ්ඩිත, අලගියවන්න
(3) මෛත්‍රේය, රාහුල, මිහිරිපැන්නේ, ගජමන් නෝනා
(4) සරණංකර, පත්තායමේ ලේකම්, ධම්මානන්ද, කවීශ්වර
(5) අනවමදර්ශි, කුමාරදාස, ධර්මාරාම, වෛදේහ (……)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිරවද්‍ය ප්‍රකාශය** තෝරන්න.
(1) 'යංශය' යනු 'ය' යන්න වෙනුවට යෙදෙන අක්ෂර සංකේතයකි.
(2) 'යංශය' 'ර' කාරයෙන් පරව ද යෙදේ.
(3) 'යංශය'ට පෙර යෙදෙන ව්‍යඤ්ජනය හල් සලකුණ සහිත ව යෙදේ.
(4) අන්‍ය ව්‍යඤ්ජනවලට මෙන් හුදකලා යංශයට ද සියලු පිල්ලම් එක් කළ හැකි ය.
(5) අනුස්වාරයට පූර්වයෙන් යංශය භාවිත කළ හැකි ය. (……)

1.5. **රේඵය, රකාරාංශය, යංශය** හා **ගයනුකිත්ත** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ඖචිත්‍ය, මහෞෂධ, සවණ්, උපක්‍රම (2) ප්‍රකෘති, ඓහලෞකික, සකර්මක, අමාත්‍යාංශය
(3) ගර්වය, සුප්‍රබුද්ධ, අව්‍යය, යෞවන (4) සාමුද්‍රික, භූගර්භ, ගෞරවාර්හ, ශල්‍යාගාරය
(5) ප්‍රහර්ෂ, මූර්ධජ, ඖත්සුක්‍යය, භෞතචිකිත්සක (……)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) මාර්ග නීති, මෞලි මංගල්‍යය, රණවිරු උපහාර, සමාජ ප්‍රශ්න
(2) වෛද්‍ය විද්‍යාලය, පෙර අඹර, ප්‍රවාහණ අංශය, මඟී ජනතාව
(3) පාසල් අධ්‍යාපනය, ලාංකික අනන්‍යතාව, සාහිත්‍ය මණ්ඩපය, සමූල ඝාතනය
(4) තෙමහල් මන්දිරය, වනවාසී නිකාය, මදුරු මර්දනය, මානව හිතවාදී
(5) මාතෘ උපහාර, ආචාර්ය මණ්ඩලය, ලක් දෙරණ, කිරිය අදියර (……)

1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?
(1) පාලක, ඵල, පණ, ප්‍රදාන (2) ආකල්ප, විකල්ප, සංකල්ප, කල්ප
(3) ප්‍රමාණ, විමන, ශ්‍රමණ, සමාන (4) චන්දන, වන්දන, කැන්දන, වින්දන
(5) පරිසර, තිරසර, පරිවාර, සුකුමාර (……)

1.8. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සත්පුරුෂ - අසත්පුරුෂ, දුර්ජන, අසජ්ජන, අඥබාල
(2) උච්ච - පහත්, නීච, අධම, උසස්
(3) දැමුණු - අශාන්ත, නොදැමුණු, අසංවර, අදාන්ත
(4) දුර්ලභ - සුලභ, බහුල, අධික, බොහෝ
(5) විදග්ධ - අඥාන, මෝඩ, මූර්ඛ, අවිදග්ධ (……)

[දෙවැනි පිටුව බලන්න.

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) ස්වර්ණ - රත්රන්, කනක, හේම, රුවන් (2) කූටය - මුදුන, අග්‍රය, කුළ, මස්තකය
(3) කුරුල්ලා - විහඟ, පක්ෂියා, ද්විජ, දද (4) මුහුද - ජලනිධි, සමුද්‍ර, අර්ණව, සිඳු
(5) ස්නේහ - පෙම්වත්, ආලවන්ත, ආදරණීය, ළෙන්ගතු (......)

1.10. **විශේෂණ පූර්ව පද, උපමාන පූර්ව පද, විශේෂණ අපර පද,** හා **උපමාන අපර පද** යන **විශේෂණ සමාස** පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) පැරකුම්රජ, සුදුමල, සසරකතර, තිසරතන (2) තිසරතන, සසරකතර, සුදුමල, පැරකුම්රජ
(3) සුදුමල, පැරකුම්රජ, තිසරතන, සසරකතර (4) සුදුමල, තිසරතන, පැරකුම්රජ, සසරකතර
(5) සසරකතර, පැරකුම්රජ, තිසරතන, සුදුමල (......)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.
(1) මැරූ, දැරූ, සැරූ, වැරූ (2) පිසින, ඉසින, නසින, බසින
(3) වැස්ස, මැස්ස, බැස්ස, කැස්ස (4) පැවරීම්, ඇතිරීම්, මැතිරීම්, වැතිරීම්
(5) ඇල්ලූ, දැල්ලූ, සෙල්ලූ, ඉල්ලූ (......)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**කාලා** රසමුසු බෝජන කර පෙම්" (ආ) "**ගනිති** අය පඬුරු පෙර නියමින්"
(ඉ) "... ළෙල **දිදී** විදුලිය පබා" (ඊ) "ඔවා **දෙනු** පරහට"
(1) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, විධික්‍රියා (2) ත්‍රෛකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා
(3) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, විධික්‍රියා (4) පූර්වක්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, විධික්‍රියා,
(5) විධික්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා (......)

1.13. **උක්ත පද දෙකක්** හා **අනුක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) බැතිමතෙක්, ඇතින්නක, මිත්තණියන්, තෝ (2) තවුසකු, නීතිඥයකු, ගදඹෙක්, මඟීන්
(3) ඌරෝ, මීයෝ, බමුණෝ, බිරියන් (4) සතකු, තොප, සූරීහු, සිඟන්නන්
(5) සොරකු, කොරකු, බිහිරකු, අන්ධයෙක් (......)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) අවවාද, අවජාත, අවගුණ, අවමාන (2) සම්භාෂණ, සන්තාප, සංවේදන, සම්මාන
(3) පිරිසිදු, පිරිපුන්, පිරිසිඳ, පිරිහුණු (4) සුසර, සුමුදු, සුසිනිඳු, සුරතුරු
(5) දුර්ගුණ, දුහද, දුසිරිත්, දුෂ්කර (......)

1.15. "ආලයෙන් වෙලී **සැදී** මෙ **ලතාමණ්ඩපයෙන් වණ්ඩාතප** බණ්ඩිත වේ හිරුරැජිඳුගෙ" යන උද්ධෘතයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, කෘදන්ත හා සමාස (2) සමාස, කෘදන්ත හා සන්ධි
(3) කෘදන්ත, සන්ධි හා සමාස (4) සන්ධි, සමාස හා කෘදන්ත
(5) කෘදන්ත, සමාස හා සන්ධි (......)

1.16. **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) දේවාලය, හිමාලය, ජාත්‍යාලය, විද්‍යාලය
(2) ලට්ට-ලොට්ට, වං-හුං, ලවක්-දෙවක්, තක්කු-මුක්කු
(3) නවදොර, තුන්ලෝ, පස්පියුම්, දසදෙස
(4) ඖචිත්‍ය, කෞශල්‍ය, සෞඛ්‍ය, සෞන්දර්ය
(5) වැදිලි, විදිලි, බැඳිලි, සිඳිලි (......)

1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.
(1) දිවිසයුර, සසරකතර, හදවිල, ජීවනකුසුම (2) නිහඬ, නිමල, නිපුණ, නිවරද
(3) නිල්දිය, සුදුහුණු, රතුපලස, කළුපැල්ලම (4) රජගෙදර, තාපසාරාමය, බලුකුඩුව, ළමාසමිතිය
(5) තුන්දොස්, තෙමඟුල, අටලෝදහම, පසිඳුරන් (......)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) කොළග, නුවනග, මුවග, ගිරග (2) චූලෝදර, සහෝදර, පයෝධර, යශෝධර
(3) ගොක්කොළ, ලිබ්බොක්ක, අස්සන, කම්මල (4) සම්මන්ත්‍රණ, සානුනාසික, සානුකම්පික, සමලංකෘත
(5) ඈවරූදු, ඇඟිලි, දෑස, දැගසව් (......)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වැකිය** තෝරන්න.
(1) මේ පාසලෙහි ශිෂ්‍යයන් නැත.
(2) සියලු සිංහලයෝ බෞද්ධයෝ නො වෙති.
(3) මේ ගමෙහි දෙවි කෙනෙක් වැනි මිනිසෙක් වෙසෙයි.
(4) දරුවා ද මම ද මිනිස්සු ද ගමට යති.
(5) වලා පෙළ අහසේ පා වෙති. (......)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) ගුණවත්යැයි කියූ දරුවෝ දෙමාපියන් බැලීමටවත් නොපැමිණියහ.
(2) සුභාවිත ගීත කලාව වූ කලී රචනයේ ත් වාදනයේ ත් ගායනයේ ත් සුසංයෝග ය යි.
(3) විදුහල්පතිතුමාද විදුහල්පතිතුමියද දරුවන් ගේ අභිවෘද්ධි ය පිණිස වැඩ කරන්නා හ.
(4) ක්‍රීඩාභූමියේ දී දක්ෂතාව මෙන් ම සංයමය ද අතිශයින් වැදගත් ය.
(5) ගුණගරුකව ජීවත් වන්නෝ නිහඬ තාව අගය කරති. (......)

(ලකුණු 20 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සංස්කෘතික පරිසර විද්‍යාව නම් සංකල්පය පුරාවිද්‍යා ශික්ෂණයට පමණක් සීමා වූවක් නොවේ. එය දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව ආදී පුළුල් පරාසයක දිවෙන වෙනත් සමාජයීය හා මානව ශාස්ත්‍ර විෂයක්ෂේත්‍රයන් සමග ද බද්ධව පවතී. සංස්කෘතික පරිසර විද්‍යාවේ දී වඩාත් අවධානයට යොමු කෙරෙන්නේ අර්ථකථනාත්මක පුරාවිද්‍යාවේ ප්‍රධාන න්‍යායාත්මක සංකල්පයක් ලෙස සැලකෙන පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂයය පිළිබඳව ය. පොදුවේ ගත් කල සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂයය සඳහා ක්‍රමික පදනම සැකසී ඇත්තේ දහඅටවන සියවසේ සිට පමණ ය. එතෙක් පැවති දේවනිර්මාණවාදී අදහස් බිඳ දමමින් චාර්ල්ස් ඩාවින්, තෝමස් හක්ලිස් ආදීන් ජීවවිද්‍යාත්මක පරිණාමයක් නැති නම් අනුවර්තීය යාන්ත්‍රණයක් පිළිබඳ ව දැක්වූ අදහස් ද කාල්මාක්ස්, ෆෙඩ්රිච් එංගල්ස් වැන්නන් සමාජ පරිණාමය පිළිබඳ ව දැක්වූ අදහස් ද මේ සඳහා මූල බීජ සපයා ඇත. බටහිර චින්තනය තුළ ඇති වූ අනුවර්තීය දාර්ශනික පරිණාමය බොහෝ ශික්ෂණයන්හි ගමන් මාර්ගය තීරණාත්මක ලෙස වෙනස් කිරීමට සමත් විය. පරිණාමවාදය, ව්‍යුහවාදය, නූතනවාදය හා පශ්චාද්නූතනවාදය මෙහි ලා ප්‍රධාන ගාමක බලවේග වශයෙන් විශාල මෙහෙයක් ඉටු කරනු හඳුනාගත හැකි ය. මෙම සංකල්පවල බලපෑම පුරාවිද්‍යා ශික්ෂණය කෙරෙහි ද විවිධාකාර න්‍යායාත්මක එළඹුම් ඔස්සේ සම්ප්‍රේෂණය වීම වර්ෂ 1960 පමණ සිට නව පුරාවිද්‍යාව නැතහොත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් න්‍යායාත්මක සංකල්පයක් පුරාවිද්‍යා ශික්ෂණය තුළ වර්ධනය වීමෙන් පැහැදිලි වෙයි. ඉන් අනතුරුව විශේෂයෙන් පශ්චාද්නූතනවාදයේ ආභාසයෙන් පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් සංකල්පයක් වර්ෂ 1970 පමණ සිට බටහිර රටවල බිහිවීමෙන් ද ඉහත සංකල්පවල බලපෑම තහවුරු වෙයි. මේ සියලු න්‍යායාත්මක සංකල්ප පුරාවිද්‍යාව තුළ පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාවේ දිශානතිය හා එහි භූමිකාවේ ස්වරූපය කෙරෙහි තීරණාත්මක බලපෑම් ඇති කළ ඒවා ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට නම් මූලික වශයෙන් ම මිනිසා සහ පරිසරය අතර පැවති අන්‍යෝන්‍ය සබඳතාවයේ ස්වරූපය හඳුනාගත යුතු ය. මානව ක්‍රියාකාරකම් පරිසරය මත පුළුල් පරාසයක් පුරා ව්‍යාප්ත වන ස්වරූපයේ වෙනස්කම් ඇති කිරීමට සමත් ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව තත්ත්වාකාරයෙන් අවබෝධ කර ගැනීමට ඉවහල් වන තවත් වැදගත් න්‍යායාත්මක සංකල්ප දෙකක් ලෙස පරිණාමය හා අනුවර්තනය හැඳින්විය හැකි ය.

(i) සංස්කෘතික පරිසර විද්‍යාව බැඳී පවතින්නේ කවර විෂයයන් සමග ද?
(ii) අර්ථකථනාත්මක පුරාවිද්‍යාවෙහි ප්‍රධාන න්‍යායාත්මක සංකල්පය ලෙස සැලකෙන්නේ කුමක් ද?
(iii) බොහෝ ශික්ෂණයන්හි ගමන් මග තීරණාත්මක ලෙස වෙනස් කිරීමට බලපෑ ගාමක බලවේග මොනවා ද?
(iv) පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව බිහිවන්නේ කවර විෂයයක ආභාසයෙන් ද?
(v) පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට ඉවහල් වන්නේ කවර සංකල්ප ද?

(ලකුණු 10 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අධ්‍යාපනයෙහි ලා ඉතා වැදගත් මෙහෙයක් කෞතුකාගාරවලින් සිදු විය හැකි බව බොහෝ දෙනා පිළිගනිති. කෞතුකාගාර ප්‍රදර්ශන භාණ්ඩ, ඉගැන්වීමෙහි දී ඉතා ප්‍රයෝජනවත් උපකරණ වන අතර පන්තියෙහි දී උගන්වන විෂය කරුණු වඩාත් තහවුරු කිරීම සඳහා ගුරුවරුනට ඒවා භාවිත කළ හැකි ය. බොහෝ කෞතුකාගාර වැඩසටහන් විමසීමේ දී පාසල් ළමයින් සඳහා මේවායින් සිදු කළ හැකි සේවාව අප්‍රමාණ බව පැහැදිලි වේ. මේ වැඩසටහන්වල සාර්ථකභාවය සහ කාර්යසාඵල්‍යයට හේතු වන සාධක ගණනාවක් ඇති බව ද සැලකිය යුතු ය. බාල පරපුරෙහි අනාගතය රැඳී ඇත්තේ ගුරුවරුන් අත හෙයින් ඔවුන් විසින් සමාජයට ඉමහත් සේවයක් ඉටු කරනු ලැබිය යුතු ය යන්න වර්තමානයේ පිළිගත් මතය යි. තමන් භාරයේ සිටින දරුවන් තැන්පත්, හොඳ හැදීමෙන් යුත්, ප්‍රයෝජනවත් පුරවැසියන් බවට පත් කිරීමේ භාරදූර වගකීම ඔවුන් සතු ය. මෙම බරපතළ වගකීම පන්ති කාමරයෙහි ඉගැන්වීමෙන් පමණක් ඉටු කළ නොහැකි බැවින් පාසල් අධ්‍යාපන පටිපාටියට අතිරේක ව කෞතුකාගාරවලින් ගත හැකි ප්‍රයෝජන බෙහෙවින් අගය කෙරේ. නානා යුගවලට සහ දේශවලට අයත් වූ ද විවිධ අංශවලට අයත් වූ ද තථ්‍ය වූ සහ ඉතා විශ්වාස කටයුතු වූ ද වස්තු කෞතුකාගාරවල දක්නට ඇත. මේවායින් බොහෝ වස්තු එරටෙහි වෙනත් තැනක දී දකින්නට වත් අධ්‍යයනය කරන්නට වත් පාසල් ළමයින්ට හෝ ගුරුවරුන්ට හෝ හැකිවෙතොත් ඒ කලාතුරකිනි.

(ලකුණු 15 යි.)

[හතරවැනි පිටුව බලන්න.

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) සිංහල ගීතය පෝෂණයෙහි ලා ජන සාහිත්‍යයෙන් ලැබී ඇති ආභාසය
(ii) අදූරදර්ශී මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික විපත්ති
(iii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා අනාගත අභියෝග
(iv) ලාංකේය ශ්‍රම බලකායට යාචක ප්‍රජාව සම්බන්ධ කර ගැනීමේ ක්‍රමෝපාය
(v) රටක සංවර්ධනය කෙරෙහි සමබර වූ විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාව
(vi) ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි පෞද්ගලික විශ්වවිද්‍යාලයවල බලපෑම (ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදෙස් තැන් ඇතොත් නිදෙස් කොට** ලියන්න.
(i) දරුවෝ එහි යතත් අපි එහි නො යමු.
(ii) අපි ජයගතිමු'යි දේශපාලකයන් උදම් ඇනූහ.
(iii) ඇත දියඹෙහි පිහිනන තල්මසුන් අපට පෙනෙති.
(iv) මවුපියෝ යහපත් වෙත් නම් දරුවෝ ද යහපත් වෙති.
(v) අම්මා ද අක්කා ද මම ද එහි ගියෙමි. (ලකුණු 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.
(i) ශිෂ්‍යයෝ මහාචාර්යතුමා පසසති.
(ii) දඩයක්කාරයෝ අභයභූමියට වැදී වනසතුන් දඩයම් කළහ.
(iii) නවකතාකරුවෝ විචාරකයන් හෙළා දකිති.
(iv) ව්‍යාපාරිකයෝ තම උත්සව සඳහා ගායකයන් ගෙන්වති.
(v) ඔවුහු අප මුළා කළහ. (ලකුණු 05 යි.)

(ඉ) **නිවැරදි වැකියක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
(i) දරු වියොවින් (ඔවුන්/ඔවුහු) හඬා වැලපෙති.
(ii) ස්තුති කථාවෙන් අනතුරුව (සභාව/සභාතොමෝ) විසිර ගියේ ය.
(iii) නාහිමියෝ (මිනිසුන්/මිනිස්සු) ලවා විහාර භූමිය පිළිසකර කරවති.
(iv) පියා විසින් (අප/අපි) රක්නා ලදුමු.
(v) (සොරුන්/සොරු) ආහ'යි ඔවුහු බිය වූහ. (ලකුණු 05 යි.)

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.
(i) ඔවුන්ට **ප්‍රවේණියෙන්** හිමි වූ වස්තුව බොහෝ ය.
(ii) සිංහල ජනශ්‍රුතියට **පුරාවෘත්ත** ද අයත් වෙයි.
(iii) සිංහලයා බටහිර සිරිත්-විරිත් **අන්ධානුකරණය** එවක ගත්කරුවන්ගේ උපහාසයට ලක් විය. (ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.
(i) මධ්‍ය කාලයට අයිති
(ii) වචනවල නිෂ්පත්තිය
(iii) කෙනකුගේ ඉරණම දැනගත් තැනැත්තා (ලකුණු 03 යි.)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.
(i) පුද්ගල ................................ ගොඩනැඟීමට අධ්‍යාපනය ද ඉවහල් වෙයි.
(ii) යෞවන ................................ ඔජ නංවන බවට ඇමතිතුමා පොරොන්දු විය.
(iii) සෑම සංස්කෘතියකට ම ................................ අංග ද අත්‍යවශ්‍ය වේ.
(iv) පුද්ගලයා.................... බන්ධනයන් කෙරෙහි ගිජු වෙයි.
(v) ඒ ශිෂ්‍යයා.................... ඥානයෙන් යුක්ත ය.
(vi) පැරණි කවියා අලංකාර .................... කිරීමෙහි ලා දක්ෂ ය.
( ලෞකික, ව්‍යවහාරික, කුසලතා, පෞරුෂය, භෞතික, භාවිත) (ලකුණු 03 යි.)

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.
(i) ඔහු තනතුරකට **පත්** වෙයි.
(ii) **සඳ** මත පා තැබීම කළ නොහැකි දෙයක් බව ඇතැමුන්ගේ විශ්වාසය යි.
(iii) අයදුම්පතක මුලින් ම ලිවිය යුත්තේ තම **නම** යි.
(iv) **පුර** පොහොය සෑම මසක් පාසා ම උදා වෙයි.
(v) වැද්දා වැවෙන් මාළු **බා** වනයට යයි.
(vi) **දන** රැස් කිරීම කවුරුත් ප්‍රිය කරති. (ලකුණු 06 යි.)

[පස්වැනි පිටුව බලන්න.

**6.** පහත දැක්වෙන වාක්‍යවල **තදකළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය** දක්වා ඇත. ඒවායෙහි **අනුඅංගය** දක්වන්න.

(i) තනතුරු පිටුපස **ලුහුබඳින** මිනිස්සු ඇතැම් විට **පාපතර** ක්‍රියාවල **ද** නිරත වෙති. (**බඳින** - කෘදන්ත, **පාපතර** - තද්ධිත, **ද** - නිපාත)

(ii) **බමුණාණෝ සූර්යෝදයට** පෙර **ගංගානදියෙහි** ජලස්නානය කළහ. (**බමුණාණෝ** - තද්ධිත, **සූර්යෝදය** - සන්ධි, **ගංගානදිය** - සමාස)

(iii) **සුනිල්** දියදහර මත සුපිපි **සුදුනෙළුම** පරිසරය **ප්‍රභාවත්** කළේ ය. (**සුනිල්** - උපසර්ග, **සුදුනෙළුම** - සමාස, **ප්‍රභාවත්** - තද්ධිත)

(iv) දරුවා **ගසින්** ගෙඩියක් කඩා, **පිහියෙන්** එය **කපමින්** මුවගට සිනා නැගී ය. (**ගසින්** - විභක්ති, **පිහියෙන්** - විභක්ති, **කපමින්** - ක්‍රියා)

(v) **දෙසබසරුස** නගනු වස් මහමෙහෙයක් **කළ කුමරතුගුවෝ** හෙළහවුල ඇරඹූහ. (**දෙසබසරුස** - සමාස, **කළ** - කෘදන්ත, **කුමරතුගුවෝ** - විභක්ති) (ලකුණු 15 යි.)

**7.** (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) කථාවේ ප්‍රමාණයට ක්‍රියාව නැත
(ii) කිසිම විදිහකින් නිදහසක් නැති වීම
(iii) උගතා කලබල නොවෙයි
(iv) ආපසු නොඑන පුද්ගලයා අලාභ කොට යැම
(v) නොසිතූ අන්දමේ ප්‍රතිඵලයක් ලැබීම
(vi) පමණ දැන කටයුතු කිරීම (ලකුණු 03 යි.)

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) හතර බීරි කථාව
(ii) තිකිණි සෙවීම
(iii) බක තපස් රැකීම
(iv) තෝන් ලණුව දා ගැනීම
(v) ඇගේ මාළු නටනවා
(vi) වහ කඳුරු කැවීම (ලකුණු 03 යි.)

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පද සැදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) ආවාහ - විවාහ
(ii) අක්කා - නගෝ
(iii) මහත - දෙහෙත
(iv) දරු - මල්ලෝ
(v) නහින - දෙහින
(vi) පොඩි - පට්ටම් (ලකුණු 03 යි.)

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) ගහමච්චා
(ii) ඔයනවා
(iii) හොයනවා
(iv) වැහි බිත්තර
(v) තැම්ම
(vi) මන්ඩාරම (ලකුණු 03 යි.)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) කමත අඹනවා
(ii) ඇඹියා
(iii) දිස්ටිය
(iv) අම්බුලි මාමා
(v) උද්දෙරි
(vi) කරවාඩය (ලකුණු 03 යි.)

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අහාප්‍රියයාණනිඔබමාදක්නටපැමිණියේසාරමසකටපසුවයිස්වාමීනිඔබනොමැතිවගෙවීගියශීතසෘතුවමටග්‍රීෂ්මයක්මවියදැන්වසන්තසෘතුවපැමිණඇතකෝකිලයෝකූජනයකරතිමයූරයෝකේකාධ්වනිපවත්වතිමුළුපරිසරයමසශ්‍රීකත්වයෙන්බරවඇතමෙවරනම්මාඅතැරනොයනුමැනවපෙම්බරාණනිමාප්‍රේමියනිමටසමාවුවමැනවඅපගේපෞද්ගලිකසුඛවිහරණයටවඩාජාතියේආරක්ෂාවදේශයේඅභිමානයමෙන්මවංශපරම්පරාවේප්‍රෞඪත්වයප්‍රමුඛත්වයෙහිලාසැලකියයුතුයපරසතුරන්ගෙන්රටගලවාගැනීමේකාර්යයෙහිව්‍යාවෘතවසිටිනබැවින්සේනාසංවිධානයටමුල්තැනදීමටසිදුවියඒකෙසේවුවත්මාහෙටනැවතසටන්බිමටයායුතුයඑසේනම්ප්‍රියයදියනාමාමේසැකසූරළුභෝජනයඅනුභවකොටමල්පහන්ගෙනවහවහාඅපිඉසුරුමුනිවිහාරයටයමුමටඔබසමඟඑහිදීකළයුතුමන්ත්‍රණයක්ඇතස්වාමීනිඅපිවිහාරයවැඳදියපොකුණඅබියසඋද්‍යානයටයමුමාප්‍රියසුභදාණනිමානිවසෙහිදිවිගෙවනුයේහුදකලාවමයඔබගේනැදෑයෝදමටනොයෙකුත්ඇනුම්පදකියතිවඳඑකියකැයිනිග්‍රහකරතිඅනේමාප්‍රියයමටඔබවැනිමවූපුත්රුවනකලබාදෙන්නැයිඈඔහුගේඇකයේවාඩිවීපපුතුරටහිසතබාකනටසෙමින්මිමිණුවායප්‍රේමියමමඑයඉටුකරන්නෙමියිඔහුදඇයදැඩිවතමළයටසමීපකරගත්තේය

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **කාර්යය, ප්‍රාර්ථනා** යන වචන රේඵය යොදා නැවත ලියන්න.

(iii) '**පුද්ගල + ඉක - පෞද්ගලික** නම් **භූත + ඉක**' කෙසේ සකස් වේ ද?

(iv) '**ප්‍රෞඪ**' යන්නෙහි ස්වර හා ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.

(v) '**කණ්ඨජ, අඝෝෂ, මහාප්‍රාණයක්**' සහිත වචනයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(ලකුණු 15 යි.)

* * *

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2017

### 71 - සිංහල II

### ලකුණු බෙදීයාම

1, 2, 3 ඇතුළු ව ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| 1. | ප්‍රශ්නය | (බහුවරණ) | - | ලකුණු 01 x 20 = 20 |
| 2. | ප්‍රශ්නය | (අ) අවබෝධය | - | ලකුණු 02 x 05 = 10 |
| | | (ආ) සාරාංශය | - | ලකුණු = 15 |
| | | | | 25 |
| 3. | ප්‍රශ්නය | රචනය | - | ලකුණු 25 |
| 4. | ප්‍රශ්නය | (අ) | - | ලකුණු 01 x 05 = 05 |
| | | (ආ) | - | ලකුණු 01 x 05 = 05 |
| | | (ඉ) | - | ලකුණු 01 x 05 = 05 |
| | | | | 15 |
| 5. | ප්‍රශ්නය | (අ) | - | ලකුණු 01 x 03 = 03 |
| | | (ආ) | - | ලකුණු 01 x 03 = 03 |
| | | (ඉ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (ඊ) | | ලකුණු 01 x 06 = 06 |
| | | | | 15 |
| 6. | ප්‍රශ්නය | | - | ලකුණු (01 x 03) × 05 = 15 |
| 7. | ප්‍රශ්නය | (අ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (ආ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (ඉ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (ඊ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (උ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | | | 15 |
| 8. | ප්‍රශ්නය | (i) පද බෙදීම | | = 03 |
| | | විරාම ලක්ෂණ | | = 04 |
| | | (ii) - (v) | - | ලකුණු 02 x 04 = 08 |
| | | | | 15 |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2017

විෂය අංකය / பாட இலக்கம்: **71**

විෂයය / பாடம்: **සිංහල II**

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I කොටස /பகுதி I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|
| 01. | 4 | 11. | 3 |
| 02. | 3 | 12. | 4 |
| 03. | 5 | 13. | 1 |
| 04. | 5 | 14. | 4 |
| 05. | 3 | 15. | 5 |
| 06. | 5 | 16. | 1 |
| 07. | 2 | 17. | 2 |
| 08. | 2 | 18. | 5 |
| 09. | 1 | 19. | 2 |
| 10. | 4 | 20. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 = 20

## II කොටස

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සංස්කෘතික පරිසර විද්‍යාව නම් සංකල්පය පුරාවිද්‍යා ශික්ෂණයට පමණක් සීමා වූවක් නොවේ. එය දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව ආදී පුළුල් පරාසයක දිවෙන වෙනත් සමාජීය හා මානව ශාස්ත්‍ර විෂයක්ෂේත්‍රයන් සමග ද බද්ධව පවතී. සංස්කෘතික පරිසර විද්‍යාවේ දී වඩාත් අවධානයට යොමු කෙරෙන්නේ අර්ථකථනාත්මක පුරාවිද්‍යාවේ ප්‍රධාන න්‍යායාත්මක සංකල්පයක් ලෙස සැලකෙන පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂයය පිළිබඳව ය. පොදුවේ ගත් කල සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂයය සඳහා ක්‍රමික පදනම සැකසී ඇත්තේ දහඅටවන සියවසේ සිට පමණ ය. එතෙක් පැවති දේවනිර්මාණවාදී අදහස් බිඳ දමමින් චාර්ල්ස් ඩාවින්, තෝමස් හක්ලිස් ආදීන් ජීවවිද්‍යාත්මක පරිණාමයක් නැති නම් අනුවර්තීය යාන්ත්‍රණයක් පිළිබඳ ව දැක්වූ අදහස් ද කාල්මාක්ස්, ෆෙඩ්රිච් එංගල්ස් වැන්නන් සමාජ පරිණාමය පිළිබඳ ව දැක්වූ අදහස් ද මේ සඳහා මූල බීජ සපයා ඇත. බටහිර චින්තනය තුළ ඇති වූ අනුවර්තීය දාර්ශනික පරිණාමය බොහෝ ශික්ෂණයන්හි ගමන් මාර්ගය තීරණාත්මක ලෙස වෙනස් කිරීමට සමත් විය. පරිණාමවාදය, ව්‍යුහවාදය, නූතනවාදය හා පශ්චාද්නූතනවාදය මෙහි ලා ප්‍රධාන ගාමක බලවේග වශයෙන් විශාල මෙහෙයක් ඉටු කරනු හඳුනාගත හැකි ය. මෙම සංකල්පවල බලපෑම පුරාවිද්‍යා ශික්ෂණය කෙරෙහි ද විවිධාකාර න්‍යායාත්මක එළඹුම් ඔස්සේ සම්ප්‍රේෂණය වීම වර්ෂ 1960 පමණ සිට නව පුරාවිද්‍යාව නැතහොත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් න්‍යායාත්මක සංකල්පයක් පුරාවිද්‍යා ශික්ෂණය තුළ වර්ධනය වීමෙන් පැහැදිලි වෙයි. ඉන් අනතුරුව විශේෂයෙන් පශ්චාද්නූතනවාදයේ ආභාසයෙන් පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් සංකල්පයක් වර්ෂ 1970 පමණ සිට බටහිර රටවල බිහිවීමෙන් ද ඉහත සංකල්පවල බලපෑම තහවුරු වෙයි. මේ සියලු න්‍යායාත්මක සංකල්ප පුරාවිද්‍යාව තුළ පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාවේ දිශානතිය හා එහි භූමිකාවේ ස්වරූපය කෙරෙහි තීරණාත්මක බලපෑම් ඇති කළ ඒවා ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට නම් මූලික වශයෙන් ම මිනිසා සහ පරිසරය අතර පැවති අන්‍යෝන්‍ය සබඳතාවයේ ස්වරූපය හඳුනාගත යුතු ය. මානව ක්‍රියාකාරකම් පරිසරය මත පුළුල් පරාසයක් පුරා ව්‍යාප්ත වන ස්වරූපයේ වෙනස්කම් ඇති කිරීමට සමත් ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව තත්ත්වාකාරයෙන් අවබෝධ කර ගැනීමට ඉවහල් වන තවත් වැදගත් න්‍යායාත්මක සංකල්ප දෙකක් ලෙස පරිණාමය හා අනුවර්තනය හැඳින්විය හැකි ය.

(i) සංස්කෘතික පරිසර විද්‍යාව බැඳී පවතින්නේ කවර විෂයයන් සමග ද?
(ii) අර්ථකථනාත්මක පුරාවිද්‍යාවෙහි ප්‍රධාන න්‍යායාත්මක සංකල්පය ලෙස සැලකෙන්නේ කුමක් ද?
(iii) බොහෝ ශික්ෂණයන්හි ගමන් මග තීරණාත්මක ලෙස වෙනස් කිරීමට බලපෑ ගාමක බලවේග මොනවා ද?
(iv) පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව බිහිවන්නේ කවර විෂයයක ආභාසයෙන් ද?
(v) පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට ඉවහල් වන්නේ කවර සංකල්ප ද?

(ලකුණු 10 යි.)

(i) පුරාවිද්‍යාව, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව හා ආර්ථික විද්‍යාව
(ii) පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව
(iii) පරිණාමවාදය, ව්‍යුහවාදය, නූතනවාදය හා පශ්චාද්නූතනවාදය
(iv) පශ්චාද්නූතනවාදයේ ආභාසයෙනි
(v) මිනිසා සහ පරිසරය අතර පුළුල් පරාසයක් පුරා පැවති අන්‍යෝන්‍ය සබඳතාවයේ ස්වරූපය, පරිණාමය හා අනුවර්තනය

(ලකුණු 2 X 5 = 10 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශයේ වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අධ්‍යාපනයෙහි ලා ඉතා වැදගත් මෙහෙයක් කෞතුකාගාරවලින් සිදු විය හැකි බව බොහෝ දෙනා පිළි. කෞතුකාගාර ප්‍රදර්ශන භාණ්ඩ, ඉගැන්වීමෙහි දී ඉතා ප්‍රයෝජනවත් උපකරණ වන අතර පන්තියෙහි දී උගන්වන ද... කරුණු වඩාත් තහවුරු කිරීම සඳහා ගුරුවරුනට ඒවා භාවිත කළ හැකි ය. බොහෝ කෞතුකාගාර වැඩසටහන් විමසීමේ දී පාසල් ළමයින් සඳහා මේවායින් සිදු කළ හැකි සේවාව අප්‍රමාණ බව පැහැදිලි වේ. මේ වැඩසටහන්වල සාර්ථකභාවය සහ කාර්යසාඵල්‍යයට හේතු වන සාධක ගණනාවක් ඇති බව ද සැලකිය යුතු ය. බාල පරපුරෙහි අනාගතය රැඳී ඇත්තේ ගුරුවරුන් අත හෙයින් ඔවුන් විසින් සමාජයට ඉමහත් සේවයක් ඉටු කරනු ලැබිය යුතු ය යන්න වර්තමානයේ පිළිගත් මතය යි. තමන් භාරයේ සිටින දරුවන් තැන්පත්, හොඳ හැදීමෙන් යුත්, ප්‍රයෝජනවත් පුරවැසියන් බවට පත් කිරීමේ භාරදූර වගකීම ඔවුන් සතු ය. මෙම බරපතළ වගකීම පන්ති කාමරයෙහි ඉගැන්වීමෙන් පමණක් ඉටු කළ නොහැකි බැවින් පාසල් අධ්‍යාපන පටිපාටියට අතිරේක ව කෞතුකාගාරවලින් ගත හැකි ප්‍රයෝජන බෙහෙවින් අගය කෙරේ. නානා යුගවලට සහ දේශවලට අයත් වූ ද විවිධ අංශවලට අයත් වූ ද තථ්‍ය වූ සහ ඉතා විශ්වාස කටයුතු වූ ද වස්තු කෞතුකාගාරවල දක්නට ඇත. මේවායින් බොහෝ වස්තු එරටෙහි වෙනත් තැනක දී දකින්නට වත් අධ්‍යයනය කරන්නට වත් පාසල් ළමයින්ට හෝ ගුරුවරුන්ට හෝ හැකිවෙතොත් ඒ කලාතුරකිනි.

(ලකුණු 15 යි.)

- ❖ කෞතුකාගාරවලින් අධ්‍යාපනයට වැදගත් මෙහෙයක් ඉටුවන බව පිළිගැනීම
- ❖ පන්තියේ උගන්වන විෂය කරුණු තහවුරු කිරීමට කෞතුක ප්‍රදර්ශන භාණ්ඩ ප්‍රයෝජනවත් වන බව
- ❖ බාල පරපුරෙහි අනාගතය ගුරුවරුන් අත රැඳී ඇතැයි යන වර්තමාන පිළිගැනීම
- ❖ දරුවන් තැන්පත්, හොඳ හැදීමෙන් යුත්, ප්‍රයෝජනවත් පුරවැසියන් කිරීමේ කාර්යය පන්ති කාමර ඉගැන්වීමෙන් පමණක් ඉටුකර ගත නොහැකි වීම
- ❖ නොයෙක් යුගවලට සහ දේශවලට අයත් වූ ද, තථ්‍ය වූ හා ඉතා විශ්වාස කටයුතු වූ ද පුරා වස්තු කෞතුකාගාරවල තිබීම
- ❖ කෞතුකාගාරවලින් තොර ව වෙනත් තැනක දී එහි ඇති පුරා වස්තු දකින්නට මෙන් ම අධ්‍යයනය කරන්නට ද ළමයින්ට හෝ ගුරුවරුන්ට නොහැකි වීම

**ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු 02ක් අඩු වේ. වචන සංඛ්‍යාව 55 - 65 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි වේ නම් ලකුණු 3ක් අඩු වේ.**

| | |
|---|---|
| **සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට** | - ලකුණු 03 යි |
| **අක්ෂර වින්‍යාසයට** | - ලකුණු 04 යි |
| **අන්තර්ගතයට** | - ලකුණු 08 යි |

3. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.
   - (i) සිංහල ගීතය පෝෂණයෙහි ලා ජන සාහිත්‍යයෙන් ලැබී ඇති ආභාසය
   - (ii) අදූරදර්ශී මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික විපත්ති
   - (iii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා අනාගත අභියෝග
   - (iv) ලාංකේය ශ්‍රම බලකායට යාවත් ප්‍රජාව සම්බන්ධ කර ගැනීමේ ක්‍රමෝපාය
   - (v) රටක සංවර්ධනය කෙරෙහි සමබර වූ විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාව
   - (vi) ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි පෞද්ගලික විශ්වවිද්‍යාලයවල බලපෑම (ලකුණු 25 යි.)

**වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය

ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම

iii. කරුණුවල පැහැදිලි බව

iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම

v. ව්‍යාකරණ දෝෂ රහිත වීම

vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම

vii. සුදුසු ලෙස ඡේද වෙන් කිරීම

viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

ix. විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

(i) දරුවෝ එහි යතත් අපි එහි නො යමු.

(ii) අපි ජයගතිමු යි දේශපාලකයන් උදම් ඇනූහ.

(iii) ඈත දියඹෙහි පිහිනන තල්මසුන් අපට පෙනෙති.

(iv) මවුපියෝ යහපත් වෙත් නම් දරුවෝ ද යහපත් වෙති

(v) අම්මා ද අක්කා ද මම ද එහි ගියෙමි.

(ලකුණු 05 යි.)

(i) දරුවන් එහි යතත් අපි එහි නො යමු.

(ii) අපි ජයගතිමු යි දේශපාලකයෝ උදම් ඇනූහ.

(iii) ඈත දියඹෙහි පිහිනන තල්මස්සු අපට පෙනෙති.

(iv) නිවැරදි වාක්‍යකි.

(v) අම්මා ද අක්කා ද මම ද එහි ගියෙමු.

**(ලකුණු 1 X 5 යි.)**

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) ශිෂ්‍යයෝ මහාචාර්යතුමා පසසති.

(ii) දඩයක්කාරයෝ අභයභූමියට වැදී වනසතුන් දඩයම් කළහ.

(iii) නවකතාකරුවෝ විචාරකයන් හෙළා දකිති.

(iv) ව්‍යාපාරිකයෝ තම උත්සව සඳහා ගායකයන් ගෙන්වති.

(v) ඔවුහු අප මුළා කළහ.

(ලකුණු 05 යි.)

(i) ශිෂ්‍යයන් විසින් මහාචාර්යතුමා පැසසෙයි/ පැසසේ/ පසසනු ලබයි/ පසසනු ලැබෙයි.

(ii) දඩයක්කාරයන් විසින් අභයභූමියට වැදී වනසත්තු දඩයම් කෙරුණු/ කැරුණු/ කරන ලදහ/ ලද්දාහු ය/ ලද්දාහ/ ලද්දෝ ය, කරනු ලැබූහ/ ලැබුවෝ ය/ ලැබූවාහ/ ලැබුණෝ ය.

(iii) නවකතාකරුවන් විසින් විචාරකයෝ හෙළා දැකෙති/ දැකෙත්, දකිනු ලැබෙති/ ලැබෙත්/ ලබති/ ලබත්.

(iv) ව්‍යාපාරිකයන් විසින් තම උත්සව සඳහා ගායකයෝ ගෙන්වෙති/ ගෙන්වෙත්, ගෙන්වනු ලබති/ ලැබෙති/ ලබත්/ ලැබෙත්.

(v) ඔවුන් විසින් අපි මුළා කෙරුණුමු/ ඉොරුණෙමු/ කැරුණුමු, කරන ලදුමු/ ලද්දෙමු, කරනු ලැබුවෙමු/ ලැබූමු.

4 (ඉ) **නිවැරදි වැකියක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) දරු වියෝවින් (ඔවුන්/ඔවුහු) හඬා වැලපෙති.

(ii) ස්තුති කථාවෙන් අනතුරුව (සභාව/සභාතොමෝ) විසිර ගියේ ය.

(iii) නාහිමියෝ (මිනිසුන්/මිනිස්සු) ලවා විහාර භූමිය පිළිසකර කරවති.

(iv) පියා විසින් (අප/අපි) රක්නා ලදුමු.

(v) (සොරුන්/සොරු) ආහ'යි ඔවුහු බිය වූහ. (ලකුණු 05 යි.)

(i) ඔවුහු
(ii) සභාව
(iii) මිනිසුන්
(iv) අපි
(v) සොරුන්

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න

(i) ඔවුන්ට **පුවේණියෙන්** හිමි වූ වස්තුව බොහෝ ය.

(ii) සිංහල ජනශ්‍රැතියට **පුරාවෘත්ත** ද අයත් වෙයි.

(iii) සිංහලයා බටහිර සිරිත්-විරිත් **අන්ධානුකරණය** එවක ගත්කරුවන්ගේ උපහාසයට ලක් විය. (ලකුණු ⁰³ යි.)

(i) පරපුරෙන්, පරම්පරාවෙන්, පාරම්පරිකව, සන්තතියෙන්, උරුමයෙන්

(ii)
- පුරාතන කාලය පිළිබඳ තොරතුරු ඇතුළත් කතා
- පෙර සිට පැවත එන කතා
- අතීතයේ සිට පැමිණෙන කතාන්දර

(iii) විමසීමෙන් තොරව කෙරෙන අනුගමනය

(ලකුණු 1 X 3)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත්** සුදුසු තනි පද ලියන්න.

(i) මධ්‍ය කාලයට අයිති

(ii) වචනවල නිෂ්පත්තිය

(iii) කෙනකුගේ ඉරණම දැනගත් තැනැත්තා (ලකුණු 03 යි.)

(i) මධ්‍යතන
(ii) නිරුක්ති
(iii) දෛවඥයා

(ලකුණු 1 X 3)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) පුද්ගල ................................ ගොඩනැඟීමට අධ්‍යාපනය ද ඉවහල් වෙයි.
(ii) යෞවන ................................ ඔප් නංවන බවට ඇමතිතුමා පොරොන්දු විය.
(iii) සෑම සංස්කෘතියකට ම ................................ අංග ද අත්‍යවශ්‍ය වේ.
(iv) පුද්ගලයා.................... බන්ධනයන් කෙරෙහි ගිජු වෙයි.
(v) ඒ ශිෂ්‍යයා.................... ඥානයෙන් යුක්ත ය.
(vi) පැරණි කවියා අලංකාර .................... කිරීමෙහි ලා දක්ෂ ය.

( ලෞකික, ව්‍යවහාරික, කුසලතා, පෞරුෂය, භෞතික, භාවිත) (ලකුණු 03 යි.)

(i) පෞරුෂය
(ii) කුසලතා
(iii) භෞතික
(iv) ලෞකික
(v) ව්‍යවහාරික
(vi) භාවිත

(ලකුණු $1/2$ X 6 = 3)

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) ඔහු කනපුරකට **පත්** වෙයි.
(ii) **සඳ** මත පා තැබීම කළ නොහැකි දෙයක් බව ඇතැමුන්ගේ විශ්වාසය යි.
(iii) අයදුම්පතක මුලින් ම ලිවිය යුත්තේ තම **නම** යි.
(iv) **පුර** පොහොය සෑම මසක් පාසා ම උදා වෙයි.
(v) වැද්දා වැවෙන් මාළු **බා** වනයට යයි.
(vi) **දන** රැස් කිරීම කවුරුත් ප්‍රිය කරති. (ලකුණු 06 යි.)

(i) පත් (පැමිණීම), පත්‍ර, කොළ, මාර්ග, පියාපත්, භාජන, තැටි
(ii) සඳ (චන්ද්‍රයා), උතුම්, කාන්තාව, සන්ධිය, ඡන්දස, චන්දන, කාලය, සන්ධ්‍යාව, සැකය, ලකුණ, ඡන්දය, සිත
(iii) නම (නාමය), නමය (ඉලක්කම), නම (විධික්‍රියාව), හිමිනම
(iv) පුර (පිරුණු), නගරය, රට, අන්තඃපුරය,
(v) බා (පූර්වක්‍රියාව), භාග්‍ය, භාගය, කොටස, බාහුව, අඩු වූ, බියවීම, ව්‍යක්තයා, උළුවස්සේ හෝ ජනේලයේ කණුව
(vi) දන (ධනය), ජනතාව, දනය, පිළිස්සෙන, කැපීම

(ලකුණු 1 X 6)

6. පහත දැක්වෙන වාක්‍යවල **තදකළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය** දක්වා ඇත. ඒවායෙහි **අනුඅංගය** දක්වන්න.

(i) තනතුරු පිටුපස **ලුහුබඳින** මිනිස්සු ඇතැම් විට **පාපතර** ක්‍රියාවල ද නිරත වෙති. (**බඳින** - කෘදන්ත, **පාපතර** - තද්ධිත, **ද** - නිපාත)

(ii) **බමුණාණෝ සූර්යෝදයට** පෙර **ගංගානදියෙහි** ජලස්නානය කළහ. (**බමුණාණෝ** - තද්ධිත, **සූර්යෝදය** - සන්ධි, **ගංගානදිය** - සමාස)

(iii) **සුනිල්** දියදහර මත සුපිපි **සුදුනෙළුම** පරිසරය **ප්‍රභාවත්** කළේ ය. (**සුනිල්** - උපසර්ග, **සුදුනෙළුම** - සමාස, **ප්‍රභාවත්** - තද්ධිත)

(iv) දරුවා **ගසින්** ගෙඩියක් කඩා, **පිහියෙන්** එය **කපමින්** මුවගට සිනා නැඟී ය. (**ගසින්** - විභක්ති, **පිහියෙන්** - විභක්ති, **කපමින්** - ක්‍රියා)

(v) **දෙසබසරැස** නගනු වස් මහමෙහෙයක් **කළ කුමරතුඟුවෝ** හෙළහවුල ඇරඹූහ. (**දෙසබසරැස** - සමාස, **කළ** - කෘදන්ත, **කුමරතුඟුවෝ** - විභක්ති) (ලකුණු 15 යි.)

(i) **බඳින** - වර්තමාන කෘදන්ත/වර්තමාන කර්තෘ කාරක කෘදන්ත
**පාපතර** - තුලනාර්ථයේ/ වඩා යන අර්ථයේ තද්ධිත
**ද** - සමුච්චයාර්ථ/අවධාරණාර්ථ/ (පද/වාක්‍ය) සම්බන්ධාර්ථ නිපාතය

(ii) **බමුණාණෝ** - ගෞරවාර්ථයේ තද්ධිත
**සූර්යෝදය** - ස්වරාදේශ සන්ධිය, ගුණ සන්ධිය
**ගංගානදිය** - විශේෂණ සමාසය/ විශේෂණ උත්තර (අපර) පද සමාසය

(iii) **සුනිල්** - උත්තමාර්ථ/උත්කෘෂ්ටාර්ථ/ භූෂණාර්ථ/ ශෝභනාර්ථ/ මනා යන අර්ථයේ තද්ධිත
**සුදුනෙළුම** - විශේෂණ සමාසය/ විශේෂණ පූර්ව පද සමාසය
**ප්‍රභාවත්** - අස්ත්‍යර්ථයේ/ ඇත යන අර්ථයේ තද්ධිත

(iv) **ගසින්** - අවදි විබත්/අවධි විභක්තිය/පඤ්චමී විභක්තිය/ අපාදනාර්ථයේ පඤ්චමී
**පිහියෙන්** - කරණ විභක්තිය
**කපමින්** - මිශ්‍ර ක්‍රියා/ මුසු කිරිය

(v) **දෙසබසරැස** - ද අරුත් සමස්/ දකාරාර්ථ සමාස/ ද්වන්ද්ව සමාස/ 'ච' අර්ථ සමාස
**කළ** - අතීත කාල කෘදන්ත/ අතීත කාල කර්තෘ කාරක කෘදන්ත
**කුමරතුඟුවෝ** - පෙර විබත/ප්‍රථමා විභක්තිය

**(ලකුණු (1 X 3) X 5 = 15 යි)**

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) කථාවේ ප්‍රමාණයට ක්‍රියාව නැත
(ii) කිසිම විදිහකින් නිදහසක් නැති වීම
(iii) උගතා කලබල නොවෙයි
(iv) ආපසු නොඑන පුද්ගලයා අලාභ කොට යෑම
(v) නොසිතූ අන්දමේ ප්‍රතිඵලයක් ලැබීම
(vi) පමණ දැන කටයුතු කිරීම (ලකුණු 03 යි.)

(i)
- කතාව දෝලාවෙන් ගමන පයින්
- කියන කොට එහෙමයි කරන කොට මෙහෙමයි
- ගොරවන තරමට වහින්නෙ නෑ
- කටින් බතල කොළ හිටවනව වගේ

(ii)

- ❖ සෙක්කුවේ බැඳපු ගොනා වගේ
- ❖ කොටි වලිගය අල්ලගත්තා වගේ
- ❖ හිරයට අහුවුණු පුවක් ගෙඩිය වගේ
- ❖ ඇම ගිල්ල මාළුවා වගේ

(iii)

- ❖ පිරුණු කළේ දිය නොසැලේ

(iv)

- ❖ යන යකා කොරහත් බිඳගෙන යනවා වගේ

(v)

- ❖ වඳින්න ගිය දේවාලේ ඉහේ කඩා වැටුණා වගේ
- ❖ විදීදේ හාවට වැදුණේ පඳුරට

(vi)

- ❖ ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න ඕන ලු

**(ලකුණු $^1/_2$ X 6 = 3)**

(ආ) පහත දී ඇති රූඪිවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.

(i) හතර බීරි කථාව (ii) නිකිණි සෙවීම

(iii) බක තපස් රැකීම (iv) තෝන් ලණුව දා ගැනීම

(v) ඇගේ මාළු නටනවා (vi) වහ කඳුරු කැවීම

(ලකුණු 03 යි.)

(i) කිසිවෙකුට නොතේරුණු

(ii) ඉතා අපහසු කාර්යයක නිරතවීම

(iii) බොරු සිල් පෙන්වීම

(iv) තමන්ට රිසි පරිදි හැසිරවීම

(v) අධික කෝපය/ දැඩි තරහ

(vi) හිරසවීම, වපාවීම, දැඩි අකමැත්ත

**(ලකුණු $^1/_2$ X 6 = 3)**

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පද ඈඳී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) ආවාහ - විවාහ (ii) අක්කා - නගෝ

(iii) මහත - දෙමහත (iv) දරු - මල්ලෝ

(v) තගින - දෙගින (vi) පොඩි - පට්ටම

(ලකුණු 03 යි.)

(i) එකිනෙකට විරුද්ධ පද දෙකක් යෙදීම

(ii) අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති පද දෙකක් යෙදීම

(iii) පළමු පදය අර්ථවත් ව ද දෙවෙනි පදය අර්ථ විරහිත ව ද යෙදීම

(iv) අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති පද දෙකක් යෙදීම

(v) පළමු පදය අර්ථවත් ව ද දෙවෙනි පදය අර්ථ විරහිතව ද යෙදීම

(vi) ස්වරූපයෙන් අසමාන පද දෙකක් එකතු වී අර්ථය තීව්‍ර කිරීම

**(ලකුණු $^1/_2$ X 6 = 3)**

(ඡ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) ගහමච්චා (ii) ඔයනවා
(iii) හොයනවා (iv) වැහි බිත්තර
(v) තැම්ම (vi) මන්ධාරම

(ලකුණු 03 යි.)

(i) විසි කරනවා
(ii) පොල් ලෙලි ගහනවා
(iii) සෙවිලි කරනවා
(iv) වැහි පොද/ බින්දු
(v) දේවදානය
(vi) වැහි අඳුර

(ලකුණු $^{1}/_{2}$ X 6 = 3)

(ජ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) කමත අඹනවා (ii) ඇඹයා
(iii) දිස්ටිය (iv) අම්බුලි මාමා
(v) උද්දෙරි (vi) කරවාඩය

(ලකුණු 03 යි.)

(i) කමත ශුද්ධ පවිත්‍ර කරනවා
(ii) ගොයම් පාගන මිනිසා
(iii) බැල්ම හෙළීම
(iv) හඳ/ සඳ/ චන්ද්‍රයා/ නිශාකර/ උළිඳු/ තුරුපති/ තරුපති
(v) උඩට විසවීම
(vi) තද සුළඟ

(ලකුණු $^{1}/_{2}$ X 6 = 3)

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අහාප්‍රියයාණනිඔබමාදක්නටපැමිණියේසාරමසකටපසුවයිස්වාමිනිඔබනොමැතිවගෙවීගියශීතසෘතුවමටග්‍රීෂ්මයක්මවිය
දැන්වසන්තසෘතුවපැමිණඇතකෝකිලයෝකූජනයකරතිමයූරයෝකේකාධ්වනිපවත්වතිමුළුපරිසරයම
සශ්‍රීකත්වයෙන්බරවඇතමෙවරනම්මාඅතැරනොයනුමැනවපෙම්බරාණනිමාප්‍රේමියනිමටසමාවුවමැනවඅපගේ
පෞද්ගලිකසුඛවිහරණයටවඩාජාතියේආරක්ෂාවදේශයේඅභිමානයමෙන්මවංශපරම්පරාවේප්‍රෞඪත්වයප්‍රමුඛත්ව
යෙහිලාසැලකියයුතුයපරසතුරන්ගෙන්රටගලවාගැනීමේකාර්යයෙහිව්‍යාවෘතවසිටිනබැවින්සේනාසංවිධානය
ටමුල්තැනදීමටසිදුවියඒකෙසේවුවත්මාහෙටනැවතසටන්බිමටයායුතුයඑසේනම්ප්‍රියයදියනාමාමේසැකසූරළුභෝජනය
අනුභවකොටමල්පහන්ගෙනවහවහාඅපිඉසුරුමුනිවිහාරයටයමුමටඔබසමඟඑහිදීකළයුතුමන්ත්‍රණයක්ඇතස්වාමිනිඅපිවි
හාරයවැඳදියපොකුණඅබියසඋද්‍යානයටයමුමාප්‍රියසුභදාණනිමානිවසෙහිදිවිගෙවනුයේහුදකලාවමයඔබගේනෑදෑ
යෝදමටනොයෙකුත්ඇනුම්පදකියතිවඳඑකියකැයිනිග්‍රහදකරතිඅනේමාප්‍රියයමටඔබවැනිමවූපුත්රුවනකලබාදෙන්නැයිඇ
ඔහුගේඇකයේවාඩිවීපපුතුරටහිසතබාකනටසෙමින්මිමිණුවායප්‍රේමියමමඑයඉටුකරන්නෙමියිඔහුදඇයදැඩිවතමළයටසමීප
කරගත්තේය

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **කාර්යය, ප්‍රාර්ථනා** යන වචන ශ්‍රේඵය යොදා නැවත ලියන්න.

(iii) '**පුද්ගල + ඉක** - පෞද්ගලික නම් භූත + ඉක' කෙසේ සකස් වේ ද?

(iv) '**ප්‍රෞඪ**' යන්නෙහි ස්වර හා ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.

(v) '**කණ්ඨජ, අඝෝෂ, මහාප්‍රාණයක්**' සහිත වචනයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(ලකුණු 15 යි.)

(i) "අහා! ප්‍රියයාණනි, ඔබ මා දක්නට පැමිණියේ සාරමසකට පසුවයි. ස්වාමිනි, ඔබ නොමැති ව ගෙවී ගිය ශීත සෘතුව මට ග්‍රීෂ්මයක් ම විය. දැන් වසන්ත සෘතුව පැමිණ ඇත. කෝකිලයෝ කූජනය කරති. මයූරයෝ කේකාධ්වනි පවත්වති. මුළු පරිසරය ම සශ්‍රීකත්වයෙන් බර ව ඇත. මෙවර නම් මා අතැර නො යනු මැනව පෙම්බරාණනි." "මා ප්‍රේමියනි, මට සමාවුව මැනව. අපගේ පෞද්ගලික සුඛ විහරණයට වඩා ජාතියේ ආරක්ෂාව, දේශයේ අභිමානය මෙන් ම වංශපරම්පරාවේ ප්‍රෞඪත්වය ප්‍රමුඛත්වයෙහි ලා සැලකිය යුතු ය. පරසතුරන්ගෙන් රට ගලවා ගැනීමේ කාර්යයෙහි ව්‍යාවෘත ව සිටින බැවින් සේනා සංවිධානයට මුල්තැන දීමට සිදු විය. ඒ කෙසේ වුවත් මා හෙට නැවත සටන් බිමට යා යුතු ය." "එසේ නම් ප්‍රියය, දිය නා, මා මේ සැකසූ රළු භෝජනය අනුභව කොට, මල්පහන් ගෙන, වහ වහා (වහවහා) අපි ඉසුරුමුනි විහාරයට යමු. මට ඔබ සමඟ එහි දී කළ යුතු මන්ත්‍රණයක් ඇත. ස්වාමිනි, අපි විහාරය වැඳ දිය පොකුණ අබියස උද්‍යානයට යමු. මා ප්‍රිය සුභදාණනි, මා නිවසෙහි දිවි ගෙවනුයේ හුදකලාව ම ය. ඔබගේ නෑදෑයෝ ද මට නොයෙකුත් ඇනුම්පද කියති; වඳ එකියකැ'යි නිග්‍රහ ද කරති. අනේ! මා ප්‍රියය, මට ඔබ වැනි ම වූ පුත් රුවනක ලබා දෙන්නැ'යි ඈ ඔහුගේ ඇකයේ වාඩි වී, පපුතුරට හිස තබා කනට සෙමින් මිමිණුවා ය." "ප්‍රේමිය, මම එය ඉටු කරන්නෙමි" යි ඔහු ඇය දැඩි ව තම ළයට සමීප කර ගත්තේ ය.

පද බෙදීමට - ලකුණු 04 යි.
විරාම ලක්ෂණවලට - ලකුණු 03 යි.

(ii) කාර්ය/කාර්ය්‍ය, ප්‍රාර්ථනා
(iii) භෞතික
(iv) ප් + ර් + ඖ + ඪ් + අ
(v) සුඛ/ප්‍රමුඛත්වයෙහි

(ලකුණු 2 X 4 = 08 යි.)

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ
## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්

සිංහල මාධ්‍ය

**විද්‍යා - ගණිත**

- [ ] 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- [ ] 12-13 රසායන විද්‍යාව - 1
- [ ] 12-13 රසායන විද්‍යාව - 2
- [ ] 12-13 රසායන විද්‍යාව - 3
- [ ] 12-13 රසායන විද්‍යාව - 4
- [ ] 12-13 රසායන විද්‍යාව - 5
- [ ] 12-13 භෞතික විද්‍යාව - 1
- [ ] 12-13 භෞතික විද්‍යාව - 2
- [ ] 12-13 භෞතික විද්‍යාව - 3
- [ ] 12-13 භෞතික විද්‍යාව - 4
- [ ] 12-13 භෞතික විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 1
- [ ] 12-13 ජීව විද්‍යාව - 2
- [ ] 12-13 ජීව විද්‍යාව - 3
- [ ] 12-13 ජීව විද්‍යාව - 4
- [ ] 12-13 ජීව විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- [ ] 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 1
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 2
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 3
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 4

**වාණිජ්‍යය**

- [ ] 12 ගිණුම්කරණය
- [ ] 13 ගිණුම්කරණය
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 13 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව
- [ ] 13 ආර්ථික විද්‍යාව - 1
- [ ] 13 ආර්ථික විද්‍යාව - 2

**කලා**

- [ ] 12 සිංහල
- [ ] 13 සිංහල
- [ ] 12 දේශපාලන විද්‍යාව
- [ ] 13 දේශපාලන විද්‍යාව
- [ ] 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 12 ඉන්දියානු ඉතිහාසය
- [ ] 13 ඉන්දියානු ඉතිහාසය
- [ ] 12 භූගෝල විද්‍යාව
- [ ] 13 භූගෝල විද්‍යාව
- [ ] 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes

English Medium

- [ ] 12 Accounting
- [ ] 13 Accounting
- [ ] 12 Business Studies
- [ ] 13 Business Studies
- [ ] 12 Economics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර

සිංහල මාධ්‍ය

- [ ] සාමාන්‍ය දැනීම
- [ ] 12 ගිණුම්කරණය - 1
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.